කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

ජාත්‍යන්තර අධ්‍යයනය - INTS - E 3015

ජාත්‍යන්තර දේශපාලනය

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ජාත්‍යන්තර දේශපාලනය විග්‍රහ කිරීමේ දී , යථාර්ථවාදී සහ ලිබරල්වාදී ප්‍රවේශයන් මගින් සැපයෙන දායකත්වය පිළිබඳ විග්‍රහ කරන්න.

02. ලෝක ඉතිහාසයේ විවිධ යුගවල දී ඇති වූ සුවිශේෂී දේශපාලන ප්‍රවනතාවන් පිළිබඳ විස්තර කරන්න.

03. i. ගැටුම් නිර්වචනය කොට අභ්‍යන්තර ගැටුම් ඇතිවීමට බලපාන්නා වූ සාධක පැහැදිලි කරන්න.

ii. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගන්නා විවිධ ක්‍රමවේදයන් අතර වෙනස්කම් හඳුන්වා දෙමින් එම ක්‍රමවේද උපයෝගී වන අවස්ථා පිළිබඳ විමසන්න.

04. පහත සඳහන් ප්‍රශ්න කොටස් දෙකෙන් <u>එකකට</u> පමණක් පිළිතුරු සපයන්න.

i. අප්‍රිකානු කලාපය තුල පවතින සන්නද්ධ ගැටුම්වල ස්වභාවය පැහැදිලි කොට ඒවා සමනයකර ගනිමින් ආර්ථික සහයෝගීතාව වර්ධනය කර ගැනීම සඳහා කලාපීය සංවිධානවලට පැවරෙන කාර්යභාරය පහදන්න.

ii. දකුණු චීන මුහුද ආශ්‍රිතව ගොඩනැගී ඇති අර්බුදය පැහැදිලි කොට, මතභේදයට තුඩුදී තිබෙන රාජ්‍යයන් අතර ගැටුම් නිරාකරණය සඳහා ආසියාන් සංවිධානය ගෙන ඇති පියවර කෙතරම් සාර්ථකදැයි විග්‍රහ කරන්න.

05. පලස්තීන අර්බුදය නිර්මාණය වීම සම්බන්ධයෙන් ලෝක බලවතුන්ගේ භූමිකාව පැහැදිලි කොට, පවතින ජාත්‍යන්තර දේශපාලන පසුබිම මෙම අර්බුදය සඳහා බලපාන්නා වූ ආකාරය විස්තර කරන්න.

06. i අවිවල අවශ්‍යතාව සඳහා බලපාන්නා වූ සාධක මොනවා ද?

ii. නිරායුධකරණය සඳහා එල්ලවන අභියෝග පැහැදිලි කොට නිරායුධකරණය සඳහා මෙතෙක් ගෙන ඇති පියවර විස්තර කරන්න.

07. i එක්සත් ජාතින්ගේ සංගමයෙහි ප්‍රධාන ආයතනවල කාර්යභාරය පැහැදිලි කරන්න.

ii. ත්‍රස්තවාදය පිටුදැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංගමය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න පැහැදිලි කරන්න.

08. ජාත්‍යන්තර ගැටුම් නිරාකරණයෙහි ලා තෙවැනි පාර්ශවීය මැදිහත්වීමක් අනුගමනය කරන විවිධ ක්‍රමවේද විස්තර කරන්න.

**********************